**INSTITUTE FOR HEALTH POLICY**

**72,** පාර්ක් වීදිය, කොළඹ**-2,** ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 සැප්තැම්බර් 25
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව 12.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya


# ස.ජ.බ. අභිබවමින් අගෝස්තු මාසයේ ඡන්දදායකයින් අතර ජා.ජ.බ./ජ.විපෙ. ඉදිරියෙන් සිටී

## *2023* අගෝස්තු *IHP MRP* මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම

2023 අගෝස්තු මාසයේ පැවති නවතම ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේදී (SLOTS), 30%ක අපේක්ෂිත ඡන්දදායකයින් ප්‍රතිශතයක් ලබා සිටින ජා.ජ.බ./ජ.විපෙ., 24% ප්‍රතිශතයක් ලබා සිටින ස.ජ.බ.ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි. එක්සත් ජාතික පක්ෂයට අපේක්ෂිත ඡන්දදායකයින්ගෙන් දහයෙන් එකක් (11%) පවතින අතර, මූලික ඇස්තමේන්තු අනුව නම් නොකරන ලද වෙනත් පක්ෂ සඳහා අපේක්ෂිත ඡන්දදායකයින්ගේ අඩුවීමක් පෙන්නුම් කරයි.



SLOTS ඡන්ද දත්ත භාවිතා කරන නවතම MRP ඇස්තමේන්තු මගින් ප්‍රධාන පක්ෂවල සමස්ත තත්වයේ වෙනසක් පෙන්නුම් කරයි.




**පසුගිය වාර්තා ihp.lk වෙතින් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, “2023 ජනවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු. ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. ඡන්දදායකයින් අතර කරට කර සටනක්.”, SLOTS වාර්තාව #2023-03. *https://ihp.lk/publications/docs/SLOTSReport202303.pdf යෙන් ලබා ගත හැකිය.*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, “2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු. ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.”, SLOTS වාර්තාව #2023-06. https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf *යෙන් ලබා ගත හැකිය.*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, “2023 මාර්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම: මාර්තු මාසයේ ඡන්ද මනාප වල සුළු වෙනසක්, ජා.ජ.බ./ජ.වි.පෙ. ස.ජ.බ. ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි, එ.ජා.ප.යේ නැගීටීමේ ලකුණක් පෙන්නුම් කරයි.”, SLOTS වාර්තාව #2023-11. *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230419.pdf යෙන් ලබා ගත හැකිය.*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, “ජා.ජ.බ./ජ.වි.පෙ. තව දුරටත් ඉදිරියෙන් සිටින අතරම, ස.ජ.බ. සාපේක්ෂව සම මට්ටමේ පවතින අතරතුර එ.ජා.ප. සහ අනෙකුත් පක්ෂ සඳහා වන සහයෝගය අඩු වෙමින් පවතියි. 2023 අප්‍රේල් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-15. *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230525.pdf යෙන් ලබා ගත හැකිය.*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, “2023 මැයි මාසයේදී, 23% ක සහයක් ලැබූ ජා.ජ.බ./ජ.විපෙ. අභිබවා 26%ක් ලබා ගත් ස.ජ.බ. ඉදිරියට පැමිණ ඇති අතර එ.ජා.ප.සහ ශ්‍රී.ල.පො.පෙ.සඳහා වූ සහයෝගයේ ද වැඩි වීමක් පෙන්වයි. 2023 මැයි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-18. *https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306301.pdf යෙන් ලබා ගත හැකිය.*

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූලි, “2023 ජූනි මාසයේදී ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. සඳහා වූ සහයෝගය පහත වැටී ඇති අතර, එමගින් සියලු පිළිගත් පක්ෂ කෙරෙහි ජනතා කලකිරීම තවදුරටත් ඉස්මතු කර දක්වයි. 2023 ජූනි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-22. *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230727.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අගෝස්තු, “2023 ජූලි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම. ජූලි මාසයේදී ප්‍රධාන පක්ෂ සඳහා සහයෝගය සුළු වශයෙන් වෙනස් වී ඇති අතර ජා.ජ.බ./ජ.විපෙ. සහ ස.ජ.බ. ඉදිරියෙන් සිටී, නමුත් ඡන්ද දායකයින් විශාල සංඛ්‍යාවක් දායකත්වය දක්වා නොමැත.”, SLOTS වාර්තාව #2023-26. *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230821.pdf යෙන් ලබා ගත හැකිය.*

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 අගෝස්තු MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 556ක් සහ 2021 ඔක්තෝම්බර් 1 සිට 2023 සැප්තැම්බර් 13 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 12,848ක් මත පදනම් වන අතර ජා.ජ.බ./ජ.විපෙ. සඳහා 5-6%ක සහ ස.ජ.බ., ඒ.ජා.ප., ශ්‍රී.ල.පො.පෙ., ශ්‍රී.ල.නි.ප., දෙ.ජා.ස., ත.ම.වි.පු. සහ අනෙකුත් පක්ෂ සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. මීට පෙර සිදුකල යාවත්කාලීන කිරීමට වඩා අගෝස්තු යාවත්කාලීන කිරීමේදී නවතම දත්ත කට්ටලය භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා ඡන්ද ඇස්තමේන්තු අගයන්හි සුළු වෙනස්කම් සිදු ව ඇත. දෝෂ ආන්තිකය තක්සේරු කිරීම සඳහා ආකෘති නිර්මාණයේදී stochastic simulations 62ක් භාවිතා කරන ලදී.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.